සබරගමුව පලාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Sabaragamuwa province

සබරගමුව පලාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Department of Education, Sabaragamuwa province

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020

General Certificate of Education (Adv.Level) Examination, 2020

ආර්ථික විද්‍යාව II
Economics II

21 S II

පැය තුනයි
Three hours

12 ශ්‍රේණිය - තෙවන වාරය

උපදෙස් ඃ

☞ එක් කොටසකින් අවමයෙන් ප්‍රශ්න දෙකක් තෝරාගෙන උපරිම ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## "අ" කොටස

1.

(i) නිෂ්පාදන හැකියා වක්‍රය නිර්මාණය කිරීම සඳහා පදනම් කරගනු ලබන උපකල්පන කවරේ ද? (ලකුණු 03 යි)

(ii) නිෂ්පාදන හැකියා වක්‍රය ඇතුලතට විතැන් වීමට බලපාන සාධක හෝ සිදුවීම් හෝ කවරේද? (ලකුණු 03 යි)

(iii) වැඩිවන ආවස්ථික පිරිවැය පිළිබිඹු කෙරෙන නිෂ්පාදන හැකියා වක්‍රයක් නිර්මාණය කොට පහත සඳහන් සිදුවීම් නිෂ්පාදන හැකියා වක්‍ර රූප සටහන් මගින් පෙන්නුම් කරන්න.

(අ) පුහුණු ශ්‍රමිකයන් විශාල සංඛ්‍යාවක් වෙනත් රටවල් කරා සංක්‍රමණය වීම.

(ආ) ආර්ථික පසුබැසීමක්.

(ඉ) වඩා ඵලදායී පොහොර වර්ගයක් හඳුන්වා දීම.

(ඊ) ආර්ථික වෘද්ධිය.


(උ) සේවා වියුක්තිය

(ඌ) සම්පත් බෙදාහැරීමේ කාරයක්ෂමතාවය (ලකුණු 10 යි)

(iv) පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනය වෙතින් ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනය කරා සම්පත් නැවත බෙදාහැරීමක් සිදුකරනු ලැබුවහොත් එහි ප්‍රතිවිපාක ආර්ථික විද්‍යානුකූලව පරීක්ෂා කරන්න. (ලකුණු 04 යි)

2.

(i) සිවිල් භාණ්ඩ හා මිලිටරි භාණ්ඩ පමණක් නිෂ්පාදනය කරනු ලබන එක්තරා ආර්ථිකයකට අදාළ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් පහත රූප සටහනෙහි දැක්වේ. එම ආර්ථිකය දැනට K ලක්ෂ්‍යයේ නිෂ්පාදනය කරමින් සිටී යැයි සලකන්න.




(අ) මෙම ආර්ථිකයේ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය, වැඩෙන ආවස්ථික පිරිවැය පිළිබිඹු කරන්නේ ද? (ලකුණු 02 යි)

(ආ) මෙම ආර්ථිකය යුද්ධයකට එළඹෙන්නේ නම්, නිෂ්පාදන ලක්ෂ්‍යය වෙනස් වීමට වඩාත් ඉඩක් ඇත්තේ K ලක්ෂ්‍යයේ සිට කවර ලක්ෂ්‍යයක් කරා ද? (ලකුණු 02 යි)

(ඉ) ආර්ථිකය ප්‍රතිගමනයකට හෙවත් පසුබෑමකට මුහුණ දෙනු ලැබුවහොත්, නිෂ්පාදන ලක්ෂ්‍යය වෙනස් වනුයේ K ලක්ෂ්‍යයේ සිට කවර ලක්ෂ්‍යයක් කරා ද? (ලකුණු 02 යි)

(ii) ශ්‍රමික විභාජනය, ආර්ථිකයක නිෂ්පාදන මට්ටම ඉහළ නැංවීමට හේතුවන්නේ ඇයි දැයි පැහැදිලි කෙරෙන හේතු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) හිඟකම පිළිබඳ සංකල්පය, නිෂ්පාදන හැකියා මයිම් වක්‍රයක් ආධාර කර ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) වෙළෙඳපොල ආර්ථිකයක මිල ගණන් කවර කාර්යයන් ඉටු කරනු ලැබේ ද? (ලකුණු 03 යි)

(v) විධාන ආර්ථිකයක අවාසි කවරේ දැයි සඳහන් කරන්න. (ලකුණු 04 යි)

3.

(i) භාණ්ඩයක් සඳහාවන පාරිභෝගික ඉල්ලුම නිර්ණය කරන ප්‍රධාන සාධක නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) ආදායම් හා ආදේශන ප්‍රතිවිපාක විසින් ''ඉල්ලුම් නීතිය'' පැහැදිලි කරනු ලබන්නේ කෙසේ දැයි විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iii) ඉල්ලුම වෙනස් වීම හා ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වෙනස් වීම අතර වෙනස දක්වන්න. (ලකුණු 04 යි)

(iv) ''සමාන්‍ය භාණ්ඩය'' ''බාල භාණ්ඩය'' සහ ''ගිෆන් භාණ්ඩය'' යන සංකල්ප අතර වෙනස්කම් දක්වන්න. (ලකුණු 04 යි)

(v) ''පරිගණක සඳහා ඉල්ලුම වැඩිවෙමින් තිබිය දී වුව ද, පරිගණක මිල ගණන් අඛණ්ඩව පහළ වැටෙමින් පවතී'' යෝග්‍ය රූප සටහනක් යොදා ගනිමින් මෙම තත්ත්වය පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

4. කිසියම් භාණ්ඩයක් සඳහාවන ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත දැක්වේ.

$Qd = 150 - 5P$ $\qquad\qquad$ $Qs = 75 + 10P$

ඉහත තොරතුරු ඇසුරින් පහත සඳහන් දෑ ගණනය කරන්න.

(i) වෙළෙඳපොල සමතුලිත මිල හා ප්‍රමාණය (ලකුණු 02 යි)

(ii) වෙළෙඳපොල සමතුලිතයේ දී පවතින පාරිභෝගික අතිරික්තයේ වටිනාකම (ලකුණු 03 යි)

(iii) සමතුලිත මිලේ දී ඉල්ලුම් නම්‍යතා හා සැපයුම් නම්‍යතා සංගුණකවල වටිනාකම (ලකුණු 04 යි)

(iv) රජය විසින් මෙම භාණ්ඩය මත රු. 1.50 ක ඒකක බද්දක් පැනවූ විට


(අ) බද්දෙන් පසු සමතුලිත මිල සහ ප්‍රමාණය (ලකුණු 02 යි)

(ආ) රජයේ බදු අයභාරය (ලකුණු 03 යි)

(ඉ) බද්ද හේතුවෙන් පාරිභෝගික අතිරික්තයටවන බලපෑම (ලකුණු 03 යි)

(ඊ) බද්ද නිසා සමාජයට අහිමි ව යන සුභසාධනයේ වටිනාකම (ලකුණු 03 යි)

5. පහත දැක්වෙන රූප සටහනෙහි DD මගින් වෙළෙඳපොල ඉල්ලුම් වක්‍රයත්, S සහ S + T මගින් ආණ්ඩුව විසින් විශේෂිත නිෂ්පාදන බද්දක් පැනවීමට පෙර සහ පැනවූ පසුව අදාළවන වෙළෙඳපොල සැපයුම් වක්‍රත් පිළිවෙලින් නිරූපණය කෙරේ.




(අ) බද්ද පැනවීමට පෙර පැවති සමතුලිත මිල යටතේ, ප්‍රස්තාරයේ කවර ප්‍රදේශයක් පාරිභෝගික අතිරික්තය නියෝජනය කරන්නේ ද? කවර ප්‍රදේශයක් නිෂ්පාදක අතිරික්තය නියෝජනය කරන්නේ ද? (ලකුණු 02 යි)

(ආ) නිෂ්පාදකයන් මත බද්ද පැනවූ පසුව, පාරිභෝගික හා නිෂ්පාදක අතිරික්ත දැක්වෙන්නේ ප්‍රස්තාරයේ කවර කොටස්වලින් ද? (ලකුණු 02 යි)

(ඇ) බද්දෙන් අහිමි වූ ශුභ සාධනය (පරිවාරික පිරිවැය) ප්‍රස්තාරයේ කවර ප්‍රදේශයකින් දැක්වේ ද? (ලකුණු 02 යි)

(ඈ) බද්ද මගින් ආණ්ඩුව එකතු කර ගනු ලැබූ අයභාරය ප්‍රස්තාරයේ පෙන්නුම් කරනුයේ කවර ප්‍රදේශයකින් ද? (ලකුණු 02 යි)

## “ආ” කොටස

6.

(i) මූල්‍ය පිරිවැය, ආරෝපිත පිරිවැය හා ගිණුම්කරණ ලාභය, ආර්ථික ලාභය යන සංකල්ප හඳුන්වන්න. (ලකුණු 04 )

(ii). ප්‍රාමාණික ලාභය ආර්ථික ලාභයක් ලෙස නොසැලකේ, මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 04 )

(iii). හීනවන ඵල නීතිය හා පරිමාණානුකූල ඵල නීතිය අතර වෙනස දක්වන්න. (ලකුණු 04 )

(iv). කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලියකට අදාලව පහත විස්තර ඔබට සපයා ඇත.(ස්ථාවර පිරිවැය 90ක් ලෙස සලකන්න)

| නිමවුම | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
|---|---|---|---|---|---|---|---|
| ආන්තික පිරිවැය | 45 | 15 | 8 | 10 | 27 | 53 | 65 |

එක් එක් නිමවුම් ප්‍රමාණ සඳහා පහත ඒවා ගණනය කරන්න.

අ. මුළු පිරිවැය

ආ. මුළු විචල්‍ය පිරිවැය (ලකුණු 2 × 2)

(v). නිෂ්පාදන ආයතනයක පිරිමැසුම් හටගන්නේ කෙසේදැයි දක්වන්න. (ලකුණු 04 )

7.

(i) පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය දැයි දක්වා ඔබේ පිළිතුරට හේතු පැහැදිලි කරන්න.

a) හීනවන ඵල හටගන්නා විට, මුළු නිෂ්පාදිතය පහල වැටීමට පටන් ගනී.

b) දේපොල බදු, ගොඩනැගිලි සඳහා රක්ෂණ ගාස්තු ගෙවීම සහ ක්‍රම ක්ෂය ගාස්තු ස්ථාවර පිරිවැය වේ.

c) හීනවන පල සහ අඩුවන පරිමාණානුකූල ඵල යනු එකම දෙයක් වෙනස් ආකාරවලින් ප්‍රකාශ කිරීමකි.

d) ආන්තික පිරිවැය, සාමාන්‍ය පිරිවැයට වඩා වැඩි නම්, ආන්තික පිරිවැය පහල බසිමින් තිබිය යුතුය. (ලකුණු 08 )

(ii) කර්මාන්තයක් තුලට “ප්‍රවේශවීමේ බාධක” යනුවෙන් අදහස් වන්නේ කවරක් දැයි උදාහරණ දෙකක් භාවිත කරමින් පැහැසිලි කරන්න. (ලකුණු 04 )

(iii) පූර්ණ තරගකාරී ආයතනයක සැපයුම් වක්‍රය සහ එහි ආන්තික පිරිවැය වක්‍රය අතර පවතින සම්බන්ධතාවය කුමක් ද? (ලකුණු 04 )


(iv) ආර්ථික බදු කුලිය හා සංක්‍රාම ඉපැයීම අතර වෙනස දක්වන්න. (ලකුණු 04 )

8.

(i) නිෂ්පාදන ක්‍රියාවලියේ දී ආයතනයක කෙටි කාල පරිච්ඡේදය දිගු කාල පරිච්ඡේදයෙන් වෙනස් වන්නේ කවරක් නිසා ද? (ලකුණු 04 )

(ii) පූර්ණ තරගකාරී කර්මාන්තයක සිටින නිෂ්පාදන ආයතනයක්, වෙළෙඳපල මිලට වඩා ඉහළ හෝ පහළ හෝ මිලක් තෝරා නොගන්නේ ඇයි? (ලකුණු 04 )

(iii) ඒකක 100ක සමතුලිත නිමවුම් මට්ටමක් නිෂ්පාදනය කරමින් කෙටි කාලයේ දී කටයුතු කරන පූර්ණ තරගකාරී ආයතනයක් පහත රූප සටහන මගින් නිරූපණය වේ.




සමතුලිත නිමවුමේ දී පහත සඳහන් දෑ ගණනය කරන්න.

a) ආයතනය ලබන මුළු ආභාරය (ලකුණු 02 )
b) ආයතනයේ මුළු පිරිවැය (ලකුණු 02 )
c) ආයතනයේ මුළු ස්ථාවර පිරිවැය (ලකුණු 02 )
d) ආයතනයේ මුළු ආර්ථික ලාභය හෝ පාඩුව (ලකුණු 02 )

(iv) සාමාන්‍ය මුළු පිරිවැය සහ සාමාන්‍ය විචල්‍ය පිරිවැය කෙරෙහි පහත සඳහන් දෑ බලපානුයේ කවර ආකාරයෙන් ද?

a) ආයතනයේ ගොඩනැගිලිවල බදු කුලී ඉහළ යාමක්
b) ප්‍රධාන විධායක නිලධාරියාගේ වේතනයේ ඉහළ යාමක්
c) විදුලිබල ගාස්තු පහළ වැටීමක්
d) වැටුප් අනුපාතිකයේ පහළ වැටීමක් (ලකුණු 04 )

9.

(i) සාර්ව ආර්ථික අරමුණු යන්න සනිදර්ශනව දක්වන්න. (ලකුණු 04 )
(ii) සාර්ව ආර්ථික ප්‍රතිපත්තිවන මූල්‍ය ප්‍රතිපත්තිය හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය පහදන්න. (ලකුණු 04 )
(iii) සරල ආර්ථිකයක ක්‍රියාකාරිත්වය වෘත්තාකාර ආදායම් ප්‍රවාහයක් ඇසුරෙන් දක්වන්න. (ලකුණු 04 )
(iv) කල්පිත ආර්ථිකයක් සඳහා පහත සඳහන් දත්ත ඔබට සපයා ඇත.

| අයිතමය | වටිනාකම (රු. බිලියන) |
|---|---|
| සේවක ආදායම් | 25,000 |
| දළ මෙහෙයුම් අතිරික්තය | 60,000 |
| ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය | 7,000 |
| නිෂ්පාදනය මත වෙනත් බදු අඩු කළා එම සහනාධාර | 500 |
| නිෂ්පාදිතය මත බදු | 12,000 |
| නිෂ්පාදිතය මත සහනාධාර | 2,500 |
| අවශේෂ ලෝකයෙන් ලැබෙන ශුද්ධ ප්‍රාථමික ආදායම් | - 400 |
| අවශේෂ ලෝකයෙන් ලැබෙන ශුද්ධ වර්ථන සංක්‍රාම | 10,000 |

ඉහත දත්ත පදනම් කරගනිමින් පහත සඳහන් දෑ ගණනය කරන්න.

a) මූලික මිල යටතේ දළ එකතු කළ අගය (ලකුණු 02 )
b) දළ දේශීය නිෂ්පාදිය (ලකුණු 02 )
c) ශුද්ධ ජාතික ආදායම (ලකුණු 02 )
d) වැය කළ හැකි දළ ජාතික ආදායම (ලකුණු 02 )

10.

පහත දැක්වෙන සමාහාර පරිභෝජන ශ්‍රිතය සැලකිල්ලට ගන්න.

**C = a + bYd**

(i) මෙම සමීකරණයෙහි C වලින් මුළු පරිභෝජන වියදමත්, Yd වලින් වැය කළ හැකි ජාතික ආදායම් මට්ටමත් අදහස් කෙරේ. a හා b යන සංගුණක ඔබ අර්ථ දක්වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න.
(ලකුණු 04 )

(ii) $45^0$ රේඛාවක් සහිත ප්‍රස්ථාර සටහනක් යොදා ගනිමින් සාර්ව ආර්ථික සමතුලිතය පෙන්වන්න. ඔබේ ප්‍රස්ථාර සටහනෙහි සමාහාර වියදම් ශ්‍රිතය සහ ජාතික ආදායමේ සමතුලිත මට්ටම පෙන්නුම් කරන්න.
(ලකුණු 04 )

(iii) එක්තරා ආර්ථිකයකට අදාල සාර්ව ආර්ථික දත්ත කිහිපයක් පහත දැක්වේ. (සියලුම සංඛ්‍යා රුපියල් මිලියන වලිනි)

| | | |
|---|---|---|
| ස්වායත්ත පරිභෝජනය | = | 500 |
| සැලසුම් කළ ආයෝජනය | (I) = | 1,250 |
| ආණ්ඩුවේ මිලදී ගැනිම් | (G) = | 1,000 |
| ශුද්ධ අපනයන | (NX) = | -250 |
| ආන්තික පරිභෝජන නැම්යාව (MPC) | = | 0.8 |

මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම් මට්ටම නිර්ණය කරන්න. (ලකුණු 04 )

(iv) කිසියම් ආර්ථිකයක් පිලිබඳ පහත දැක්වෙන සාර්ව ආර්ථික දත්ත සැලකිල්ලට ගන්න.

C = 60 +0.8 Yd    I = 500    G = 200    T = 150    Tr = 75

C = පරිභෝජනය
Yd = වැය කළ හැකි ජාතික ආදායම
I = ආයේජනය
G = ආණ්ඩුවේ මිලදී ගැනීම්
T = බදු අය කිරීම්
Tr = සංක්‍රාම

a) මෙම ආර්ථිකයේ ඉතුරුම් ශ්‍රිතය කුමක් ද? (ලකුණු 02 )
b) වැය කළ හැකි ජාතික ආදායම Yd = 500 ක් වේ නම්, සාමාන්‍ය පරිභෝන සහ සමාන්‍ය ඉතුරුම් නැම්යාව ගණනය කරන්න. (ලකුණු 02 )
c) සමතුලිත ජාතික ආදායම් මට්ටම කොපමණ ද? (ලකුණු 02 )
d) ආයෝජන ගුණකයේ අගය කොපමණ ද? (ලකුණු 02 )